(ඈ) "සම්මුතිය" යන පාඨයෙන්, 1944 දෙසැම්බර් මස හත්වන දින අත්සන් තැබීම සඳහා චිකාගෝවෙහි දී විවෘත කරන ලද ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවාව පිළිබඳ සම්මුතිය අදහස් කෙරෙන අතර (i) සම්මුතියේ 94 (අ) වගන්තිය යටතේ බලාත්මක වූ හා දෙපාර්ශවය විසින් අපරානුමත කරන ලද කිසියම් සංශෝධනයක් ඇත්නම් එය සහ (ii) සම්මුතියේ 90 වන වගන්තිය යටතේ පිළිගනු ලැබූ ඇමුණුමක් හෝ සංශෝධනයක් ඇත්නම් හා එම ඇමුණුම හෝ සංශෝධනය ගිවිසුම්කාර දෙපාර්ශවය විසින් දී ඇති ඕනෑම කාලයක් තුළදී බලාත්මක කර ඇත්නම් එම ඇමුණුම හෝ සංශෝධනය ඊට ඇතුළත් වේ.

(ඉ) "නම්කළ ගුවන් නැව් සමාගම" යන්නෙන් මෙම ගිවිසුමේ 3 වන වගන්තිය ප්‍රකාරව නම්කළ හා බලය පවරන ලද ගුවන් නැව් සමාගමක් හෝ නැව් සමාගම් අදහස් කෙරේ.

(ඊ) "මිල ගණන්" යනුවෙන් තැපැල් ගුවන් ප්‍රවාහනය හැර සිය නියෝජිතයන්, එවැනි ගාස්තු, මිල ගණන් හෝ අය කිරීම් පාලනය කෙරෙන තත්ත්වයන් ඇතුලුව ගුවන් සේවා මගින් සිදු කරන අය කිරීම් සිදු කරන වෙනත් ආකාරයේ ඕනෑම ප්‍රවාහන ආකාරයක් ඇතුලුව ගුවන් මගීන්, ගමන් මලු හා ගුවන් නෞකාවන් රැගෙන යාම සඳහා ඕනෑම ගාස්තුවක්, මිල ගණන් හෝ අය කිරීමක් අදහස් කරයි.

(උ) රාජ්‍යයක් සම්බන්ධයෙන් "දේශය" යන පාඨයෙන් මෙම සම්මුතියේ 2 වන වගන්තිය යටතේ දී ඇති අර්ථයම වෙයි.

(ඌ)"භාවිතා කිරීමේ අයකිරීම්" යන පාඨයෙන් ගුඩන් තොටුපොළ දේපළ හෝ ගුවනින් යාත්‍රා කිරීමට පහසුකම් සැපයීම සඳහා සිදුකළ යුතු, ශක්නුවත් බලධාරීන් විසින් හෝ ඔවුන් විසින් අවසර දෙන ලද, ගුවන් සේවා සඳහා කරනු ලබන අය කිරීම් අදහස් කෙරේ.

(ඵ) "ගුවන් සේවය" "ජාත්‍යන්තර ගුවන් සේවය", "ගුවන් නැව් සමාගම" සහ "ප්‍රවාහනයෙන් පරිබාහිර කටයුතු සඳහා නැවැතීම යන පාඨවල අර්ථත් මෙම සම්මුතියෙහි 96 වන වගන්තියෙහි ඒවාට අදාළව පිළිවෙලින් දී ඇති අර්ථයන්ම වේ.

2 වන වගන්තිය
ගුවන්ප්‍රවාහනඅයිතිවාසිකම්

1. අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ ගුවන් ප්‍රවාහන සමාගම්වලට අනුබද්ධයේ නියමකර ඇති ගුවන් ගමන් මාර්ගවල ජාත්‍යන්තර ගුවන් සේවා පැවැත්වීම

සම්බන්ධ එක් එක් ගිවිසුම්කාර පාර්ශවය විසින් අනෙක් ගිවිසුම්කාර පාර්ශවයට පහත සඳහන් අවසර ලබා දෙනු ලැබේ.

2. මෙම ගිවිසුමේ විධිවිධානවලට යටත්ව, එක් එක් පාර්ශවය මගින් නම්කරන ලද ගුවන් සමාගම්වලට පහත අයිතවාසිකම් හිමිවනු ඇත.

(අ) අනෙක් පාර්ශවයේ දේශභූමිය හරහාගොඩබෑමකින් තොරව පියාසර කිරීමට;

(ආ) ගුවන් ගමන්වලින් තොර කටයුතු සඳහා අනෙක් පාර්ශවයේ දේශභූමිය තුළ නැවැත්වීමට;

(ඇ) ජාත්‍යන්තර ගුවන් ගමන්වලදී මගීන්, බඩු බාහිරාදිය හා තැපැල් ආදිය තනි තනිව හෝ කිහිපයක් ප්‍රවාහනය කිරීම හා ගොඩබෑම සඳහා එකී දේශභූමියතුළ මෙම ගිවිසුමේ මාර්ග සටහනෙහි සඳහන් නියමිත ගුවන් ගමන් මාර්ගයන් හි නැවතුම්වල නැවැත්වීමට; සහ

(ඈ) මෙම ගිවිසුමෙන් නියම කර ඇති වෙනත් ආකාරයේ අයිතිවාසිකම්

3. එක් එක් පාර්ශවය මගින් නම්කරන ලද එහෙත් මෙහි තුන්වන වගන්තියේ (නම් කිරීම සහ බලය පැවරීම) සඳහන් නොවන ගුවන් සමාගම් විසින් මෙම වගන්තියේ 2 ඡේදයේ (අ) සහ (ආ) හි සඳහන් අයිතිවාසිකම් භුක්ති විඳිනු ඇත.

4. එක් පාර්ශවයක නම්කරන ලද ගුවන් සමාගම හෝ සමාගම් විසින් වේතන ගෙවීම සහ අනෙක් පාර්ශවයට අයත් භූමියේ යම් ස්ථානයකට අයත් මගින්, බඩු බාහිරාදිය හා තැපැල් ආදිය අනෙක් පාර්ශවයට අයත් භූමියේ ප්‍රවාහනය කිරීමේ වරප්‍රසාදය මෙම ගිවිසුම මගින් ලබා නොදෙන බව සැළකිය යුතුය.

3 වන වගන්තිය
නම්කිරීම හා බලය පැවරීම

1. නියමිත ගුවන් ගමන් මාර්ගවල ගිවිසගත් ගුවන් ප්‍රවාහන සේවා පැවැත්වීමේ කාර්යය සඳහා ගුවන්ප්‍රවාහන සමාගමක් හෝ කීපයක් රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ ලිඛිතව ගිවිසුම්කාර අනෙක් පාර්ශවය වෙත නම් කිරීමට එක් එක් පාර්ශවයට අයිතිවාසිකමක් තිබිය යුතුය.

2. නම් කරන ලද ගුවන් සමාගම මගින් ගුවන් යානයේ මෙහෙයුම් සහ ප්‍රවාහන කටයුතු වලට අදාළව මෙහෙයුම් බලය පැවරීම් සහ කාර්මික අවසරය සඳහා වූ එවැනි නම් කිරීමක් සහ අදාළ කර ගැනීමක් ලැබීමෙන් පසු පහත කරුණු

සපුරා ඇති විටෙක අනෙක් පාර්ශවය විසින් අදාළ මෙහෙයුම් බලය පැවරීම ප්‍රමාදයකින් තොරව ප්‍රදානය කළ යුතුය.

අ) නම් කරන ගුවන් සමාගම එයට අන්තර්ගත වන බව සහ එහි මූලික මෙහෙයුම් ස්ථානය නම් කරන පාර්ශවයට අයත් භූමියෙහි පවතින බව;

ආ) ගුවන් සමාගමේ ක්‍රියාකාරී නියාමන පාලනය, ගුවන් සමාගම නම් කරන පාර්ශවය සතුවන බවත් පවත්වාගෙන යන බවත්;

ඇ) ගුවන් සමාගම නම් කරන පාර්ශවයේ ගුවන් ගමන් බලධාරීන් විසින් නිකුත් කරන ලද වර්තමාන ගුවන් මෙහෙයුම්කරුවන්ගේ සහතිකයක් හෝ ඊට සමාන බලපත්‍රයක් ගුවන් සමාගම සතුව පවතින බව;

ඈ) අදාළ කර ගැනීම හෝ අදාළ කර ගැනීම් සම්මුතියේ විධිවිධානවලට අනුකූල වන බවට සළකා බලන පාර්ශවය මගින් ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන මෙහෙයුම්වලට අදාළ නීති රීති සහ රෙගුලාසි යටතේ නියම කර ඇති තත්ත්වයන්වලට අනුව ගුවන් සමාගම සුදුසුකම් සපුරා ඇති බව; සහ

ඉ) ගුවන් සමාගම නම් කරන පාර්ශවය, 7 වගන්තිය(ආරක්ෂාව), 8 වගන්තිය (ගුවන් ප්‍රවාහන ආරක්ෂාව) මගින් සපයා ඇති විධිවිධාන වලට අනුකූලවන බව.

3. අදාළ ගුවන් සමාගම මෙම ගිවිසුමට අයත් විධිවිධානවලට අනුකූල වන විටෙක, 2 වෙනි ඡේදයේ මෙහෙයුම් බලය පැවරුම් ලැබීමෙන් පසුව එසේ නම්කර ඇති සේවාවන් ඕනෑම අවස්ථාවක ආරම්භ කිරීමට නම් කරන ලද ගුවන් සමාගමකට හැකියාවක් ඇත.

4 වන වගන්තිය

බලය පැවරීම අත්හිටුවීම, අවලංගු කිරීම සහ සීමා කිරීම

1. අනෙක් පාර්ශවය මගින් නම් කරන ලද ගුවන් සමාගමකට අදාළ වන පරිදි මෙම ගිවිසුමේ 3 වැනි වගන්තියේ (නම් කිරීම සහ බලය පැවරීම) සඳහන් බලය පැවරීම් තාවකාලිකව හෝ ස්ථිරව අත්හිටුවීමට, අවලංගු කිරීමට හෝ එවැනි බලය පැවරීම් මත කොන්දේසි පැනවීමට පහත අවස්ථාවන් හි දී එක් එක් පාර්ශවයේ ගුවන් ගමන් බලධාරීන්ට අයිතියක් ඇත:

අ) නම් කරන ලද ගුවන් සමාගම ස්ථාපනය වී ඇති බව සහ එහි මූලික මෙහෙයුම් ස්ථානය නම් කරන පාර්ශවයට අයත් භූමියෙහි පවතින බවට ඔවුන් සෑහීමකට පත් නොවන විට; හෝ

ආ) ගුවන් සමාගමේ ක්‍රියාකාරී නියාමන පාලනය, ගුවන් සමාගම නම් කරන පාර්ශවය සතු නොවන විටෙක සහ පවත්වාගෙන නොයන විටෙක; හෝ

ඇ) ගුවන් සමාගම නම් කරන පාර්ශවයට,7 වගන්තිය (ආරක්ෂාව),8 වගන්තිය (ගුවන් ප්‍රවාහන ආරක්ෂාව) මගින් සපයා ඇති විධිවිධානවලට අනුකූල වීමට නොහැකි වූ විටෙක; හෝ

ඈ) නම් කිරීම ලබන පාර්ශවය මගින් ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන මෙහෙයුම්වලට සාමාන්‍යයන් අදාළවන නීති රීති සහ රෙගුලාසි යටතේ නියම කර ඇති අනෙකුත් තත්ත්වයන්ට අනුව ගුවන් සමාගම සුදුසුකම් සපුරා නොමැති බව.

2. මෙම ගිවිසුමේ නීති රීති සහ රෙගුලාසි හෝ විධිවිධාන තවදුරටත් උල්ලංඝණය වීම වැළැක්වීමට මෙම වගන්තියේ 1 වෙනි ඡේදයේ සඳහන් තත්ත්වයන්ගේ කඩිනම් අවලංගු කිරීම් අත්හිටුවීම් හෝ පැනවීම් අත්‍යාවශ්‍ය නොවන්නේ නම් එවැනි අයිතිවාසිකමක් ක්‍රියාත්මක විය යුත්තේ අනෙක් පාර්ශවයේ උපදේශකත්වය මත පමණි. එවැනි උපදේශන, දෙපාර්ශවය විසින් එකඟතාවයට පත් අනෙක් ක්‍රමයක් නොමැත්තේ නම් එක් පාර්ශවයක් විසින් කරන ලද ඉල්ලීමෙන් දින 30 ක් ඉක්මයාමට පෙරාතුව ක්‍රියාත්මක විය යුතුය.

5 වන වගන්තිය
නීතිය අදාළ කරගැනීම

1. ගුවන් යානයක් ප්‍රවේශ වීම, නවත්වා තැබීම හෝ ජාත්‍යන්තර ගුවන් යාත්‍රාකිරීම හා සම්බන්ධ ගුවන් යානය දේශභූමියෙන් පිටත්වීම හෝ එවැනි ගුවන් යානයක් මෙහෙයවීම හෝ යාත්‍රාකිරීම ආශ්‍රිත එක් ගිවිසුම්කාර පාර්ශව රාජ්‍යයක නීති රීති, රෙගුලාසි හා පරිපාටීන් සමග අදාළ දේශභූමිය තුළට ප්‍රවේශවීම, පිටත්වීම හා නවත්වා තැබීම අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ නම්කළ ගුවන් සේවයේ නීති රීති, රෙගුලාසි හා පටිපාටීන් සමග අනුකූල විය යුතුය.

2. ගුවන් යානයක් ඇතුලුවීම, අනුමැතිය ලබාගැනීම, සංක්‍රමණය, විශේෂ ගුවන් ගමන් බලපත්‍රය, රේගු හා නිරෝධායනය ආශ්‍රිත එක් ගිවිසුම්කාර පාර්ශවයක රජයේ නීති

රීති, රෙගුලාසි හා පරිපාටීන් සමග අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ නම්කළ ගුවන් සේවයේ සහ එවැනි ගිවිසුම්කාර පාර්ශවයක දේශභූමියක් ඇතුළට ගුවන් යානයක් ප්‍රවේශවීම, පිටත්වීම හා නවත්වා තැබීම ඇතුලුව එහි කාර්යය මණ්ඩලය , ගුවන් මගීන්, හා ගුවන් භාණ්ඩ ප්‍රවාහන යානා මගින් සිදුකරන කටයුතු අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ නම්කළ ගුවන් සේවයේ නීති·රීති, රෙගුලාසි හා පරිපාටීන් වලට අනුකූල විය යුතුය.

3. සංක්‍රමණික, රේගු, නිරෝධායන හා සමාන රෙගුලාසි අදාළ කරගැනීමේදී, සමාන ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනයේ නියළෙන අනෙක් පාර්ශවයේ ගුවන් සේවයට වඩා තමාගේ හෝ වෙනත් ඕනෑම ගුවන් සේවයක් සඳහා කිසිදු පාර්ශවයක් විසින් කැමැත්ත ලබා නොදිය යුතුය.

4. හිංසා සිදුකිරීම, ගුවන් මංකොල්ලය එරෙහිව ආරක්ෂක පියවර හා මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධයෙන් හැර ගුවන් මගීන්, ගමන් මලු, ගුවන් නෞකා සහ සෘජු මාර්ගස්ථ තැපැල් සේවා සාමාන්‍යය පාලන තත්වයන්ට වඩා වැඩියෙන් යටත් නොකළ යුතුය. සෘජු මාර්ගස්ථ ගමන් මලු හා ගුවන් නෞකා රේගු තීරු බද්දෙන් හා අනෙකුත් සමාන බදුවලින් නිදහස් කළයුතුය.

6 වන වගන්තිය

සහතික බලපත්‍රභාරනාගැනීම

1. එක් පාර්ශවයක් විසින් නිකුත් කළ හෝ යවන ලද සහ බලාත්මක ගුවන් සහතික, සාමාර්ථතා සහතික සහ බලපත්‍ර ගිවිසගත් සේවා මෙහෙයවීමේ අරමුණින් අනෙක් පාර්ශවය විසින් වලංගු ලෙස පිළිගත යුතු අතර එවැනි සහතික හා බලපත්‍ර මෙම සම්මුතිය යටතේ ස්ථාපිත අවම ප්‍රමිතීන්ට සමාන හෝ ඉහළ -මට්ටමකින් නිකුත් කර හා වලංගුභාවය පත් කළද, ගිවිසගත් සේවා මෙහෙයවීමේ කාර්යයයේදී අනෙක් ගිවිසුම්කාර පාර්ශවය විසින් වලංගු ලෙස පිළිගත යුතුය.

2. එක් පාර්ශවයක ගගනගාමී බලධාරීන් විසින් ඕනෑම පුද්ගලයකුට හෝ නම්කළ ගුවන් සේවයකට හෝ ගිවිසගත් සේවා මෙහෙයවන ගුවන්යානාවක් සම්බන්ධයෙන් නිකුත් කළ 1 පරිච්ඡේදයේ සඳහන් බලපත්‍ර හෝ සහතික කොන්දේසි හෝ වරප්‍රසාද මගින් සම්මුතිය යටතේ පිහිටුවාගත් අවම ප්‍රමිතීන් වලින් වෙනස්කමක් සිදුකිරීමට අවසර ලබාගත යුතු අතර ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංගමය සමග ගොනු කළයුතු එම වෙනස්කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නකාරී තත්වයක් පැහැදිලි

කරගැනීමේ අරමුණින් අනෙක් පාර්ශවය විසින් ගුවන් ගග්න බලධාරීන් අතර සාකච්ජාවක් ඉල්ලා සිටිය හැකිය.

3. එක් එක් ගිවිසුම්කාර පාර්ශවය, අනෙක් ගිවිසුම්කාර පාර්ශවය විසින් තම පාර්ශවයේ ජාතිකයන්ට පිරිනමන ලද ශක්නුවත් බව පිළිබඳ සහතිකයක් හෝ ඕනෑම බලපත්‍රයක් තම දේශයට ඉහළින් පියාසර කිරීම් ගුවන් ගමන්වල කාර්යාර්ථය සඳහා පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට එක් එක් පාර්ශවයට අයිතිය ඇත්තේය.

7 වැනි වගන්තිය

ආරක්ෂණය

1. ගුවන් ගමන් පහසුකම්, ගුවන් යානාවල සේවක පිරිස, ගුවන් යානාව සහ ගුවන් යානාව මෙහෙයවීම සම්බන්ධයෙන් එක් ගිවිසුම්කාර පාර්ශවයක් විසින් පවත්වාගෙන යන ආරක්ෂක ප්‍රමිතීන් පිළිබඳව අනෙක් පාර්ශවයට ඕනෑම අවස්ථාවකදී උපදේශන ඉල්ලා සිටි හැකිය. එම උපදේශන, එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කර දින තිහක් (30) ඇතුළත පැවැත්විය යුතුය.

2. එවැනි උපදේශනවලින් අනතුරුව, එක් ගිවිසුම්කාර පාර්ශවයක් ඉහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන්, අවම වශයෙන් සම්මුතිය ප්‍රකාරව එවකට ස්ථාපනය කරන ලද අවම මට්ටමට සමාන ලෙස හෝ ආරක්ෂක ප්‍රමිතීන් පවත්වාගෙන නොයන බව හෝ ක්‍රියාත්මක නොකරන බව අනික් පාර්ශවය විසින් සොයා ගන්නේ නම්, එසේ සොයා ගැනීම සිදුකරන ගිවිසුම්කාර පාර්ශවය එම සොයා ගැනීම පිළිබඳව සහ එම අවම ප්‍රමිතීන් සමග අනුකූලවීමට අවශ්‍ය යැයි සැලකෙන පියවර පිළිබඳව අනෙක් ගිවිසුම්කාර පාර්ශවය වෙත දැනුම් දිය යුතුය. වරද සිදුකරනු ලබන ගිවිසුම්කාර පාර්ශවය, නිවැරදි කිරීම සඳහා සුදුසු පියවර ගතයුතු අතර, වරද පිළිබඳ දැනුම්දීමෙන් දින පහළොවක් (15) ඇතුළත හෝ එකඟවන එවැනි ඊට වඩා දීර්ඝ කාල සීමාවක් ඇතුළත සුදුසු පියවර ගැනීමට අපොහොසත් වීම, 6 වැනි වගන්තිය ක්‍රියාවේ යෙදවීමට හේතුවක් විය යුතුය.

3. මෙම සම්මුතියේ 33 වැනි වගන්තියේ විධිවිධාන සම්බන්ධව සැලකීමකින් තොරව, පරීක්ෂාව මගින් අත්‍යවශ්‍ය ප්‍රමාදයක් ඇති නොවන්නේ නම් පමණක්, එක් ගිවිසුම්කාර පාර්ශවයක ගුවන් සමාගම හෝ ගුවන් සමාගම් වෙනුවෙන් මෙහෙයවීම් කටයුතු සිදුකරන හෝ බදු වැඩපිළිවෙළක් යටතේ වූ ඕනෑම ගුවන් යානයක් අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ දේශය තුළට යැදී සිටින කාල සීමාව තුළදී, අනෙක්

ගිවිසුම්කාර පාර්ශවයේ බලයලත් නියෝජිතයකුගේ පරීක්ෂාවට ලක් විය හැකියයි එකඟ වෙති. ගුවන් යානයේ සහ එහි සේවක පිරිසගේ ලිපිලේඛන වල වලංගුභාවය පරීක්ෂා කිරීම (මෙම වගන්තියේදී "රැම්ප්" පරීක්ෂණය යනුවෙන් හැඳින්වෙන) ගුවන් යානයේ සහ ඒ අවට එහි උපකරණවල මතුපිට පෙනෙන්නට තිබෙන පරිදි තත්ත්වය පරීක්ෂා කිරීම ඇතුළත් වේ.

4. අ) ගුවන් යානාවක් හෝ ගුවන් යානාවක් මෙහෙයවීමක් සම්මුතිය ප්‍රකාරව එවකට ස්ථාපනය කරන ලද අවම ප්‍රමිතීන්වලට අනුකූල නොවන බවට බරපතල ලෙස සැලකිල්ලට ගතයුතු කාරණා, රැසක්, හෝ

ආ) සම්මුතිය ප්‍රකාරව එවකට ස්ථාපනය කරන ලද ආරක්ෂක ප්‍රමිතීන් කාර්යක්ෂමව පවත්වාගෙනයාමේ හෝ ක්‍රියාත්මක කරගෙන යාමේ අඩුවක් තිබෙන බවට බරපතල ලෙස සැලකිල්ලට ගතයුතු කාරණා රැසක්,එවැනි රැම්ප් පරීක්ෂාවෙන් හෝ රැම්ප් පරීක්ෂා ගණනාවකින් අනාවරණය වේ නම්,

සම්මුතියේ 33 වැනි වගන්තිය අනුව, එම ගුවන් යානය සම්බන්ධයෙන් හෝ එම ගුවන් යානයේ සේවක පිරිස සම්බන්ධයෙන් සහතික හෝ බලපත්‍ර නිකුත් කිරීම හෝ වලංගුභාවයට පත් කිරීම සඳහා සැපයිය යුතු අවශ්‍යතා හෝ ගුවන් යානය මෙහෙයවීම සඳහා පැවරිය යුතු අවශ්‍යතා, සම්මුතියට අනුව අදාළ කාලයේදී ස්ථාපනය කරන ලද අවම ප්‍රමිතීන්වලට සමාන හෝ ඊට ඉහළ නොවන ලෙස සපුරා නොමැති බව නිගමන කිරීමට රැම්ප් පරීක්ෂණය සිදුකරන ගිවිසුම්කාර පාර්ශවයට නිදහස තිබිය යුතුය.

5. මෙම වගන්තියේ 4 ඡේදයට අනුකූලව, එක් ගිවිසුම්කාර පාර්ශවයක් විසින් නම්කරන ලද ගුවන් සමාගමක් මෙහෙයුම් සඳහා යොදා ගන්නා ගුවන් යානයක රැම්ප් පරීක්ෂාවක් සිදු කිරීම සඳහා, එම නම්කරන ලද ගුවන් සමාගමේ නියෝජිතයන් විසින් ප්‍රවේශය ලබා දීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවකදී, අනෙක් ගිවිසුම්කාර පාර්ශවයට මෙම වගන්තියේ 5 වැනි ඡේදයේ දැක්වෙන ආකාරයේ බරපතල ලෙස සැළකිල්ලට ගතයුතු කාරණා රැසක් මතුවී ඇති බව දැක්විය හැකි අතර එම උප වගන්තියේ දැක්වෙන නිගමනවලට එළඹිය හැකිය.

6. රැම්ප් පරීක්ෂණයකින්, රැම්ප් පරීක්ෂණ රැසකින්, රැම්ප් පරීක්ෂණයක් සඳහා ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීමේ, උපදේශනයක හෝ වෙනත් ආකාරයක ප්‍රතිඵලයක් ලෙස, ගුවන් සමාගමේ මෙහෙයුම් කටයුතුවල ආරක්ෂාව සඳහා වහාම පියවර ගැනීම අත්‍යවශ්‍ය වන බව එක් ගිවිසුම්කාර පාර්ශවයක් නිගමනය කරන අවස්ථාවක දී, අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ ගුවන් සමාගමේ හෝ ගුවන් සමාගම්වල මෙහෙයුම් අධිකාරී බලය වහාම අත්හිටුවීමට හෝ විවලනය කිරීමට හෝ එහත කී පාර්ශවයට අයිතිවාසිකමක් ඇත්තේය.

7. මෙම වගන්තියේ 2 හා 6 වැනි ඡේදවලට අනුකූලව, එක් ගිවිසුම්කාර පාර්ශවයක් ගන්නා යම් පියවරක්, අනෙක් ගිවිසුම්කාර පාර්ශවය අදාළ ආරක්ෂක ප්‍රමිතීන්වලට අනුකූලව කටයුතුකිරීම මත අත්හිටුවිය යුතුය.

8. 2 වන පරිච්ඡේදය සම්බන්ධයෙන්, ගිවිසගත් කාලසීමාව ගතවූ අවස්ථාවකදී ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය සමග එක් පාර්ශවයක් විසින් අනනුකූල බවට තීන්දු වුවහොත්, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ මහලේකම්වරයාගෙන් උපදෙස් ලබාගත යුතුය. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ මහලේකම්වරයාට තත්වය පිළිබඳව තෘප්තිමත් විසඳුමක් පිළිබඳව උපදෙස් ලබාදිය යුතුය.

8වැනි වගන්තිය

ගුවන් සේවාවල ආරක්ෂාව

1. ජාත්‍යන්තර නීතිය යටතේ ඇති අයිතිවාසිකම් හා බැඳීම්වලට අනුකූලව, ගිවිසුම්කාර පාර්ශව, නිත්‍යානුකූල නොවන බාධා පැමිණවීම්වලට එරෙහිව සිවිල් ගුවන් සේවාවේ ආරක්ෂාව සුරක්ෂා කිරීම සඳහා ඔවුන් සතුවන බැඳීම් එකිනෙක පාර්ශව වෙත යළි ප්‍රතිඥාදීම මෙම ගිවිසුමේ අත්‍යවශ්‍ය කොටසක් වෙයි. ජාත්‍යන්තර නීතිය යටතේ සිය අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳ පොදු නියමයන්ට සීමා නොවී 1963 සැප්තැම්බර් 14 වැනි දින ටෝකියෝහිදී අත්සන් තබන ලද ගුවන් යානය තුළදී සිදුකරනු ලබන වැරදී හා යම් යම් වෙනත් ක්‍රියා පිළිබඳ සම්මුතිය, 1970 දෙසැම්බර් 16 වැනි දින හේග්හි දී අත්සන් තබන ලද ගුවන්යානාවල නිත්‍යානුකූල නොවන අල්ලා ගැනීම් මර්දනය කිරීම පිළිබඳ සම්මුතිය. 1971 සැප්තැම්බර් 23 වැනි දින මොන්ට්‍රියල්හිදී අත්සන් තබන ලද සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාවට එරෙහි නිත්‍යානුකූල නොවන කටයුතු මර්දනය කිරීම පිළිබඳ සම්මුතිය හා 1971 සැප්තැම්බර් 23 වැනි දින මොන්ට්‍රියල්හිදී අත්සන් තබන ලද සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාවට එරෙහිව සිදුකරනු ලබන නිත්‍යානුකූල නොවන කටයුතු මර්දනය කිරීම පිළිබඳ සම්මුතියේ අතිරේකයක් වන 1988 පෙබරවාරි 24 වැනි දින මොන්ට්‍රියල්හිදී අත්සන් තබන ලද ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා මෙහෙයවනු ලබන ගුවන්තොටුපළවල දී නීතිවිරෝධී ප්‍රචණ්ඩකාරී කටයුතු මර්දනය පිළිබඳ සන්ධානය 1991 මාර්තු 1 වැනි දින මොන්ට්‍රියෙල් හි දී අත්සන් තබන ලද අනාවරණය කිරීම් සඳහා ප්ලාස්ටික් පුපුරණ ද්‍රව්‍ය සළකුණු කිරීම පිළිබඳ සම්මුතිය සහ ගිවිසුම්කාර දෙපාර්ශවයටම බැඳීම් ඇති කරන සිවිල් ගුවන්සේවාවල ආරක්ෂාව පාලනය කරනු ලබන වෙනත් බහුපාර්ශවීය ගිවිසුම්වල දක්වා ඇති ගුවන් සේවාවල ආරක්ෂක විධිවිධානවලට අනුකූලව එක් එක් ගිවිසුම්කාර පාර්ශවය විශේෂයෙන් කටයුතු කළ යුතුය.

2. එක් එක් ගිවිසුම්කාර පාර්ශවය, අනෙක් ගිවිසුම්කාර පාර්ශවය විසින් සහාය ඉල්ලා සිටිනු ලබන අවස්ථාවලදී සිවිල් ගුවන්යානා නිත්‍යානුකූල නොවන අයුරින් අල්ලා

ගැනීම් හා එවැනි ගුවන්යානා , ඒවායේ මගීන් හා කාර්ය මණ්ඩල, ගුවන් තොටුපළ හා ගුවන් ගමන් පහසුකම් හා සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාව සඳහා වන යම් යම් වෙනත් ආකාරයේ තර්ජන වැළැක්වීම සඳහා අවශ්‍ය සියලු සහාය ලබාදිය යුතුය.

3. මෙම ගිවිසුම්කාර පාර්ශව, මෙම විධිවිධාන පාර්ශවවලට එම ආරක්ෂක විධිවිධාන අදාළ වන ප්‍රමාණයට, අන්‍යොන්‍ය වශයෙන් සිදුකරන කටයුතුවලදී, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් ස්ථාපිත කරන ලද හා මෙම සම්මුතියේ ඇමුණුම් ලෙස නම්කරනු ලැබ ඇති අදාළ ගුවන් සේවා ආරක්ෂක විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. එක් එක් ගිවිසුම්කාර පාර්ශවය, තම නාමලේඛනයේ වූ ගුවන්යානා මෙහෙයවන්නන් හෝ තම දේශය තුළ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය හෝ ස්ථිර පදිංචිය ඇති ගුවන්යානා මෙහෙයවන්නන් හා තම දේශය තුළ ගුවන්තොටුපළ මෙහෙයවන්නන්ට, එවැනි ගුවන්සේවා ආරක්ෂක විධිවිධානවලට අනුකූලව ක්‍රියාකළ යුතු බවට නියම කළ යුතු හෝ පෝලන්ත ජනරජය සම්බන්ධයෙන්, යුරෝපා සංගම් ගිවිසුම් යටතේ තම දේශය තුළ ස්ථාපනය කර ඇති හා යුරෝපා සංගම් නීතියට අනුකූලව, වලංගු මෙහෙයුම් බලපත්‍ර හිමි ගුවන් යානාවල මෙහෙයවන්නන් හා ඔවුන්ගේ දේශය තුළ ඇති ගුවන් තොටුපළවල මෙහෙයවන්නන් එවැනි සිවිල් ගුවන් සේවා ආරක්ෂක විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

4. එක් එක් ගිවිසුම්කාර පාර්ශවය, අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ දේශයට ඇතුලුවීමේදී, ඉන් පිටවීමේදී හෝ එහි රැඳිසිටීමේදී අනෙක් ගිවිසුම්කාර පාර්ශවය විසින් නියම කරනු ලබන, එම පාර්ශවය පෝලන්ත ජනරජය වන කල්හි යුරෝපා සංගම් නීතිය ඇතුළුව එම රටේදී බලපැවැත්වෙන නීතියට අනුකූලවන සිවිල් ආරක්ෂක ගුවන් සේවා ආරක්ෂක විධිවිධාන පිළිපැදීමට ගුවන්යානා මෙහෙයවන්නන්ට සිදුවිය හැකි බවට එකඟවිය යුතුය.ගුවන්යානය ආරක්ෂා කර ගැනීමට හා ගුවන්යානයට ගොඩබිමේදී හෝ බඩුබාහිරාදිය පැටවීමේදී හෝ ඊට පෙරාතුව මඟින්, කාර්යමණ්ඩලය, ගෙනයනු ලබන ද්‍රව්‍ය, ගමන් මලු, ගුවන්යානා බඩු, තැපැල් ද්‍රව්‍ය හා ගුවන්යානයේ ගබඩාව පරීක්ෂා කිරීමට එක් එක් දේශය තුළදී ඵලදායී ලෙස අදාළ කරගනු ලබන පියවර ප්‍රමාණවත් තරමින් පවතින බවට එක් එක් ගිවිසුම් පාර්ශවය තහවුරු කළ යුතුය.

5. එක් එක් ගිවිසුම්කාර පාර්ශවය, විශේෂ තර්ජනයක් පවතින අවස්ථාවලදී එය මැඩලීම සඳහා යුක්ති සහගත විශේෂ ආරක්ෂක පියවර ගන්නා ලෙස අනෙක් ගිවිසුම්කාර පාර්ශවයෙන් ලද යම් ඉල්ලීමක් පිළිබඳව සානුකම්පිතව සලකා බැලිය යුතුය.

6 සිවිල් ගුවන් යානය නීති විරෝධී ලෙස අල්ලා ගැනීමේ හෝ එවැනි ගුවන් යානයක, එහි මගීන් හා කාර්ය මණ්ඩලය, ගුවන් තොටුපළ හෝ ගුවන් ගමනාගමී පහසුකම්වල ආරක්ෂාවට එරෙහි වෙනත් නීතිවිරෝධී කටයුතු පිළිබඳ යම් සිදුවීමක් හෝ එවැන්නක් සිදුවන බවට තර්ජනයක් හෝ පවතී නම් එවැනි සිදුවීමක් හෝ සිදුවීම පිළිබඳ තර්ජනය කඩිනමින් හා ආරක්ෂා සහිතව නිමා කිරීම සඳහා සන්නිවේදන කටයුතු සඳහා සහ වෙනත් යෝග්‍ය පියවර සඳහා පහසුකම් සැලසීමෙන් සහාය දැක්විය යුතුය.

7 අනෙක් පාර්ශවය විසින් මෙම ගිවිසුමේ විධිවිධාන වලින් ඉවත් වී ඇති බවට විශ්වාසකිරීම සඳහා එක් පාර්ශවයකට සාධාරණ හේතූන් පවතින අවස්ථාවකදි, පළමු පාර්ශවය විසින් උපදේශනයක් ඉල්ලා සිටිය හැකිය. එක් පාර්ශවයකින් ඉල්ලීමක් ලැබී දින පහළොවක් (15) ඇතළත එවැනි සාකච්ඡා ආරම්භ කළයුතුය. සාකච්ඡාව ආරම්භ වීමෙන් දින පහළොවක් (15) ඇතුළත තෘප්තිමත් එකඟතාවයකට එළඹීමට අපොහොසත් වීම මඟින් අනෙක් පාර්ශවය විසින් නම්කළ ගුවන් සේවය හෝ ගුවන් සේවාවන්ගේ බලය පැවරීම නවතා දැමීමට, අහෝසිකිරීමට. අත්හිටුවීමට හෝ කොන්දේසි පැනවීම සඳහා කාරණාවන් නියම කළ හැකිය. මෙම වගන්තියේ විධිවිධාන සමඟ තවදුරටත් අනුකූල නොවීම වැලැක්වීම සඳහා හා හදිසි අවස්ථාවකදී සාධාරණීයකරණය කළ අවස්ථාවකදී, පළමු පර්ශවය සඳහා ඕනෑම අවස්ථාවක අන්තර්කාලීන ක්‍රියාමාර්ග ගත හැකිය.

9වන වගන්තිය

භාවිතා කිරීමේ ගාස්තු

1. එක් ගිවිසුම්කාර පාර්ශවයක්, අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ නම් කරන ලද ගුවන් සමාගම හෝ ගුවන් සමාගම් සම්බන්ධයෙන් පනවනු ලැබූ හෝ තම ශක්නුවත් බලධාරීන්ට පනවනු ලැබීමට අවසර ලබා දී ඇත්තා වූ හෝ භාවිතා කිරීමේ ගාස්තු යුක්ති සහගත හා සාධාරණ බව එක් එක් ගිවිසුම්කාර පාර්ශවය විසින් තහවුරු කරගත යුතු අතර මෙම ගාස්තු නිවැරදි මූලධර්ම මත පදනම්කර ගතයුතු අතර මෙවැනි සේවා සඳහා වෙනත් ගුවන් සමාගම් වසින් ගෙවනු ලබන ගාස්තුවලට වඩා වැඩි නොවිය යුතුය.

2. ගිවිසුම්කාර පාර්ශවයක් තම පාර්ශවය විසින් නම් කරන ලද ගුවන් සමාගමක් හෝ සමාන ගුවන් යානා භාවිත කරමින් සමාන ජාත්‍යන්තර ගුවන් සේවා මෙහෙයවන ගුවන් සමාගම් සම්බන්ධයෙන් පනවනු ලැබූ භාවිතා කිරීමේ ගාස්තුවලට වඩා වැඩි ගාස්තුවක් අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ නම්කරන ලද ගුවන් සමාගම/ගුවන් සමාගම් සම්බන්ධයෙන් නොපැනවිය යුතු හෝ පැනවීමට අවසර ලබාදීම හෝ නොකළයුතුය.

10 වන වගන්තිය

රේගු ඖස්තු

එක් එක් ගිවිසුම්කාර පාර්ශවයේ නම්කළ ගුවන් සේවා සමාගමක් විසින් ජාත්‍යන්තර ගුවන් සේවා මඟින් මෙහෙයවයනු ලබන ගුවන් යානයක් සඳහා මෙන්ම, ඒවායේ නිත්‍ය උපකරණ, අමතර කොටස් (එන්ජීම ද ඇතුලුව) ඉන්ධන හා ස්නේහක තෙල් යානය තුළදී

පාවිච්චියට ගන්නා ලද ආහාර ද්‍රව්‍ය, බීම වර්ග, දුම්කොළ වැනි ගුවන් යානයේ ගබඩා බඩු නැවැත අපනයනය කරනු ලබන තෙක් යානය තුළම තිබෙන්නට ඉඩ හැරියොත් යානය අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ දේශයට ක්‍රේන්ද්‍ර වීමේදී අයකරනු ලබන රේගුගාස්තු, පරීක්ෂණ ගාස්තු සහ වෙනත් ගාස්තුවලින් නිදහස් කළ යුතුය.
සපයනු ලබන සේවාවේ පිරිවැය මත පදනම් කොට අයකරනු ලබන ගාස්තු හැර මෙම වගන්තියේ 1 වන ඡේදයේ සඳහන් වෙනත් තීරුබදු, ගාස්තු හා අයකිරීම් වලින් පහත සඳහන් අයිතමයන්ද නිදහස් කළ යුතුය.

(අ) අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ නම්කළ ගුවන් සේවා සමාගමක් ජාත්‍යන්තර ගුවන් සේවයක යොදවනු ලබන ගුවන් යානයක්, අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ දේශභූමිය තුළ නවතා තිබියදී යානය තුළට ඇතුල් කරන ලදුව හෝ සපයන ලදුව යානය තුළදී පාවිච්චිය සඳහා ගන්නා ගබඩා ද්‍රව්‍ය,

(ආ) එක් ගිවිසුම්කාර පාර්ශවයක නම්කළ ගුවන් සේවා සමාගමක් විසින් ජාත්‍යන්තර ගුවන් සේවයක් සඳහා යොදවන ලද ගුවන් යානයක් නඩත්තු කිරීම සඳහා හෝ අළුත්වැඩියා කිරීම සඳහා අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ දේශභූමියට සේන්ද්‍ර කර තිබියදී ලබාගන්නා ලද එන්ජින් ඇතුළු අමතර කොටස්,

(ඇ) එක් එක් ගිවිසුම්කාර පාර්ශවයක නම්කළ ගුවන් සේවා සමාගමක් විසින් ජාත්‍යන්තර ගුවන් සේවයක යොදවනු ලැබ ඇති ගුවන් යානයකට සපයනු ලබන ඉන්ධන, ලිහිසිතෙල් සහ පාරිභෝජ්‍ය තාක්ෂණික සැපයුම්, මෙම යානය නවතා තබන ගිවිසුම්කාර පාර්ශවයේ දේශභූමිය තුළ යෙදෙන ගුවන් ගමන් වලින් කොටසක් සඳහා වුවද මේවායින් කොටසක් පාවිච්චි කළ හැකිය.

(ඈ) අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ දේශභූමිය තුළ එක් එක් ගිවිසුම්කාර පාර්ශවයේ නම්කළ ගුවන් සේවාවන් විසින් භාවිත කළ වාණිජ වටිනාකමක් නොමැති වෙළඳ ප්‍රචාරක ද්‍රව්‍යය.

ගිවිසුම්කාර පාර්ශව දෙකින් ඕනෑම පාර්ශවයක ගුවන් යානයක තිබෙන වාස උපකරණ මෙන්ම වෙනත් ද්‍රව්‍ය හා සැපයුම් අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ රේගු බලධාරීන්ගේ අනුමැතිය ඇතිව පමණක් එම ගිවිසුම්කාර පාර්ශවයේ දේශභූමිය තුළදී ගොඩබැස හැකිය. එම ද්‍රව්‍ය හා සැපයුම් නැවැත අපනයනය කරන තෙක් හෝ වෙනත් ආකාරයෙන් සුදුස්සක් කරන තෙක් ඒවා රේගු රෙගුලාසිවලට අනුකූලව එකී බලධාරීන්ගේ අධීක්ෂණය යටතේ තබාගත යුතුය.

11 වන වගන්තිය

ධාරිතාව

වෙළඳපලේ වාණිජමය සළකාබැලීම් මත පදනම්ව, ජාත්‍යාන්තර ගුවන් ප්‍රවාහන සේවය මඟින් ලබා දෙන වාර ගනන හා ධාරිතාවය තීන්දු කිරීම සදහා එක් එක් පර්ශවය විසින් එක් එක් නම්කළ ගුවන් සේවවට ඉඩ ලබා දිය යුතුය.

සම්මුතියේ 15 වන වගන්තියට අනුකූලව ඒකාකාර කොන්දේසි යටතේ රේගු, තාක්ෂණික, මෙහෙයුම් හෝ පාරිසරික හේතූන් හැර අනෙක් පාර්ශවයේ නම්කළ ගුවන්සේවා මඟින් මෙහෙයවූ ගුවන් යානා වර්ගය, සේවයේ අඛණ්ඩතාය හෝ වාරගනන, ප්‍රවාහන ධාරිතාවය එක් එක් පාර්ශවයට ඒක පාර්ශිකව සීමා කළ නොහැකිය.

12 වන වගන්තිය

මිලගනන්

මෙම ගිවිසුම යටතේ මෙහෙය වූ ගුවන් සේවා සදහා අයකළ මිල ගනන් ගුවන් සේවා මඟින් නිදහසේ තීරණය කළ හැකි අතර අනුමැතියකට යටත් නොවිය යුතුය.

එක් එක් පර්ශවය විසින් සිය දේශ භූමියෙන් ඇරඹෙන ප්‍රවාහනය සදහා මිල ගනන් පිළිබඳව නම් කළ ගුවන් සේවා විසින් දන්වා යැවීමට හෝ බලධාරින් පත්කිරීම සිදු කළ යුතුය.

13 වන වගන්තිය

තරඟකාරිත්වය

නියමකර ගත් මාර්ගයන් හි ගිවිසගත් සේවාවන් මෙහෙයවීමේදී, තරඟ කිරීම සඳහා ගිවිසුම්කාර දෙපාර්ශවයේ නම්කළ ගුවන් සේවා සඳහා සාධාරණ හා සමාන අවස්ථාවක් තිබිය යුතුය.

වාණිජ හා වෙළඳපල මත පදනම් වූ සලකා බැලීම් වලට අනුව, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන ධාරිතාවය හා වාර ගණන තීරණය කිරීම සඳහා එක් එක් ගිවිසුම්කාර පාර්ශවය විසින් එක් එක් නම් කළ ගුවන් සේවයට ඉඩ සැලසිය යුතුය. කිසිදු ගිවිසුම්කාර පාර්ශවයක් විසින් ගුවන් ගමන් ධාරිතාවය, වාර ගණන හෝ නියම කරගත් වාර ගණන, හෝ ගුවන් යානාව, හෝ අනෙක් ගිවිසුම්කාර පාර්ශවය විසින් නම්කළ ගුවන් සේවය විසින් මෙහෙය වූ ගුවන්

යානාවක්, මෙම ගිවිසුමේ නියමයන්ට අනුකූලව හෝ සම්මුතිය මගින් දක්වන ලද එවැනි ඒකාකාරී තත්ත්වයන් හැර, ඒකපාර්ශිකව සීමා කිරීම සිදු නොකළ යුතුය.

තරඟකරුවෙක් බරපතල ලෙස දුර්වල කිරීමට හෝ එම තරඟකරු ගුවන් මාර්ගයෙන් බැහැර කරලීමට කිසිදු ආකාරයකින් වෙළඳපල බලය අවභාවිත කිරීමට වෙනත් ඕනෑම ගුවන් සේවාවක්, සේවාවන් හා සම්බන්ධ හෝ වෙන්ව නම්කළ ගුවන් සේවයකට හෝ ගුවන් සේවාවන්ට එක් එක් ගිවිසුම්කාර පාර්ශවයට ඉඩ ලබා නොදිය යුතුය.

14 වන වගන්තිය

ඉපැයුම් මාරු කිරීම හා විනිමය පරිවර්තනය

01. එක් ගිවිසුම්කාර පාර්ශවයක දේශය තුළදී අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ නම් කරන ලද ගුවන් සමාගම විසින් වියදම අභිබවා උපයා ගත් අදායම පරිවර්තනය කිරීම හා මාරු කිරීමේ අයිතිය එක් එක් ගිවිසුම්කාර පාර්ශවය, අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ නම් කරන ලද ගුවන් සමාගම වෙත ප්‍රදානය කරයි.එක් එක් ගිවිසුම්කාර පාර්ශව වල බලපැවැත්වෙන, වර්තමාන ගනුදෙනුවලට අදාළවන වෙළඳපළ විනිමය අනුපාතිකය යටතේ හා විදේශ විනිමය රෙගුලාසිවලට අනුකූලව මෙම පරිවර්තනය හා මාරු කිරීම කළ යුතුය.

02. එවැනි ආදායම් පිළිබඳව විනිමය පරිවර්තනය හා මාරුකිරීම සඳහා අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව සිදුකිරීමට ඉඩලබාදිය යුතු අතර එවැනි පරිවර්තනය කිරීම හා මාරුකිරීම සිදුකිරීම සඳහා බැංකු මගින් සාමාන්‍යයන් සිදුකරන අයකිරීම් හැර අනෙකුත් ඕනෑම පරිපාලන හෝ විනිමය හුවමාරු ගාස්තු වලට යටත් නොවිය යුතුය.

03. මෙම වගන්තියේ විධිවිධාන මගින් අදාළ ජාතික නීතිරීති හා රෙගුලාසි වලට අනුව දෙපාර්ශවයේ ගුවන් සේවාවල තීරු බදු, බදු හෝ දායක මුදල් වලින් නිදහස් නොවෙයි.

04. ද්විත්ව බදුකරණය වැළක්වීම සඳහා පාර්ශවයන් අතර විශේෂ ගිවිසුමක් හෝ පාර්ශවයන් අතර අරමුදල් හුවමාරුවීම නියාමනය කරන විශේෂ ගිවිසුමක් ඇත්නම්, එවැනි ගිවිසුම් බලාත්මක විය යුතුය.

15 වන වගන්තිය

වාණිජමය කටයුතු

1. ගිවිසුම්කාර පාර්ශවයක නම් කරන ලද ගුවන් සමාගම හෝ සමාගම්වලට ගිවිසුම්කාර අනෙක් පාර්ශවයේ දේශය තුළ ගුවන් ප්‍රවාහන සේවා සම්පාදනය සහ විකිණීම මෙන්ම ගුවන් ප්‍රවාහන පහසුකම් සැපයීම හේතුකොට ගත් අනෙකුත් කාරණා සඳහා කාර්යාල ස්ථාපනය කිරීමට ඉඩ ලබාදිය යුතුය.

2. ගිවිසුම්කාර පාර්ශවයක නම් කරන ලද ගුවන් සමාගමකට, අනෙක් ගිවිසුම්කාර පාර්ශවයේ දේශයට ඇතුලුවීම, වාසය කිරීම හා රැකියාවක නියුක්ත වීම සඳහා අදාළ දේශීය නීති හා රෙගුලාසිවලට අනුකූලව, ගිවිසගත් සේවාවන් ලබා දීම සම්බන්ධයෙන් අවශ්‍යය විය හැකි කළමනාකාර, වාණිජමය, මෙහෙයුම්, අලෙවිකරණය, තාක්ෂණික හා අනෙක් විශේෂඥ කාර්ය මණ්ඩල සහ නියෝජිතයින් එම අනෙක් පාර්ශවයේ දේශය තුළට ගෙන ඒමට සහ පවත්වාගෙන යාමට අයිතිවාසිකම තිබිය යුතුය.

3. මෙම කාර්ය මණ්ඩල අවශ්‍යතා නම් කරන ලද ගුවන් සමාගමේ මනාපය මත තම රටේ නිලධාරීන්ගෙන් හෝ ගිවිසුම්කාර අනෙක් පාර්ශවයේ දේශය තුළ පවත්නා වෙනත් ගුවන් සමාගමක, සංවිධානයක හෝ සමාගමක සේවාවන් උපයෝගී කොට ගනිමින් තෘප්ත කළ හැකි අතර ගිවිසුම්කාර අනෙක් පාර්ශවයේ දේශයේ දී එවැනි සේවා ඉටු කිරීමට බලය ලබාදිය හැකිය.

4. එක් පාර්ශවයක නම්කළ ගුවන් සේවයක හෝ සේවාවලට විකල්පයක් ලෙස, අනෙක් පාර්ශවයේ දේශභූමිය තුළ මෙහෙයුම් සිදුකරන අනෙකුත් ඕනෑම සංවිධානයක, සමාගමක හෝ ගුවන් සේවයක සේවා භාවිත කිරීමෙන් හෝ එහි සේවක පිරිස මගින් මෙම කාර්යය මණ්ඩල අවශ්‍යතාවයන් සපුරාලිය හැකිය.

5. අනෙක් පාර්ශවය විසින් බලාත්මක කළ නීති රීති හා රෙගුලාසිවලට නියෝජිතයන් හා කාර්යය මණ්ඩලය යටත් විය යුතු අතර එවැනි නීති රීති හා රෙගුලාසිවලට අනුකූල විය යුතුය;

   (අ) අනන්‍යෝන්‍ය පදනම මත හා අවම ප්‍රමාදයක් සහිතව, එක් එක් පාර්ශවය විසින් මෙම වගන්තියේ 2 වන පරිච්ඡේදයේ සඳහන් නියෝජිතයන් හා කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍ය රැකියා බලපත්‍ර, සංචාරක වීසා හෝ අනෙකුත් සමාන ලිපිලේඛන ලබා දිය යුතුය;

   (ආ) දින 90කට නොවැඩි කාලයක් සඳහා යම් යම් තාවකාලික රාජකාරි සිදුකරන පුද්ගලයන් සඳහා රැකියා බලපත් අවශ්‍යතාව කඩිනමින් ලබාගැනීම සඳහා දෙපාර්ශවය විසින් පහසුකම් සැලසිය යුතුය.

6. ගිවිසගත් ගුවන් ගමන් මාර්ගවල ගිවිසගත් සේවා සිදුකිරීම හෝ මෙහෙයවීමේදී, දෙපාර්ශවයේ නීති රීති හා රෙගුලාසිවලට යටත්ව, එක් පාර්ශවයක නම්කළ ඕනෑම ගුවන් සේවයක් මගින්;

(අ) එම පාර්ශවයේ නම්කළ ගුවන් සේවයක්/සේවා;

(ආ) අනෙක් පාර්ශවයේ නම් කළ ගුවන් සේවයක්/සේවා; හෝ

(ඇ) තෙවැනි පාර්ශවයේ රටක් විසින් අනෙක් පාර්ශවයේ ගුවන් සේවා සහ එවැනි තෙවන පාර්ශවයක් හරහා, වෙත හා වෙතින් සේවා සම්බන්ධයෙන් අනෙක් ගුවන් සේවා හා අනෙක් පාර්ශවයේ ගුවන් සේවා අතර එවැනි තෙවනි පාර්ශවයක් මගින් බලය පවරන හෝ සමගාමී කටයුතු සැලසුම් කෙරේනම්,එවැනි සේවා මෙහෙයවීමට හෝ සිදුකිරීමට සුදුසු මෙහෙයුම් බලය පවරන තෙවන රටක ගුවන් සේවයක්/සේවා සමග කේත හුවමාරුකරගැනීමේ කටයුතු සැලසුම් කරගත යුතුය.

7. ඕනෑම කේත හුවමාරුකරගැනීමේ ගිවිසුමට අනුව ටිකට් පත් කල්තියා වෙන්කිරීම, නිකුත් කිරීම, හා අළවිකිරීමේදී, අළවිකරණ ගුවන්සේවය මගින් ගුවන් ගමනේ එක් එක් අංශ මෙහෙයවන ගුවන් සේවය පිළිබඳව එහි සිටින ගුවන් මගීන්ට උපදෙස් ලබාදිය යුතුය.

8. ඉහත කටයුතු සැළසුම් කළ සියලුම ගුවන් සේවා මගින් සුදුසු ගුවන් මාර්ග හා ගුවන් ගමන් අයිතීන් පවත්වන කොන්දේසීන්ට ඉහත සඳහන් 6 වන හා 7 වන පරිච්ඡේද වලට යටත්ය.

9. අළවිකරන ගුවන් සේවයක් ලෙස නම්කළ ගුවන් සේවයක් විසින් පැවැත්වූ එක් එක් කේත හුවමාරු කරගැනීමේ සේවය සඳහා එම ගුවන් සේවය නම්කරන පාර්ශවයේ හිමිකම්වල ධාරිතාවයට පටහැනිව ගනන් නොගත යුතුය.

10. ගිවිසුම්කාර පාර්ශවවල නම් කරන ලද ගුවන් සමාගම් සහ භාණ්ඩ ප්‍රවාහන වක්‍ර සේවා සපයන්නන්ට ගිවිසුම්කාර පාර්ශවවල අභ්‍යන්තර හෝ බාහිර ඕනෑම ස්ථානයකට හෝ එහි සිට රේගු පහසුකම් සහිත සියලුම ගුවන් තොටුපොළ වෙත හා ඒවායේ සිට ප්‍රවාහන කටයුතු මෙහෙයවීම ඇතුලු, යෝග්‍ය පරිදි, අදාළ නීති හා රෙගුලාසිවලට යටත්ව ගුදම්ගත භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අයිතිය සමග සීමා රහිතව ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය, භාණ්ඩ සඳහා ඕනෑම පෘෂ්ඨීය ප්‍රවාහන කාර්යයක නියැළීමට අවසර ලබා දිය යුතුය. එවැනි පෘෂ්ඨීය හෝ ගුවන් මාර්ගයෙන් ප්‍රවාහනය කරන භාණ්ඩ සඳහා ගුවන් තොටුපොළ රේගු මෙහෙයුම් හා පහසුකම් ලැබීමේ අයිතියක් ඇත.සිය පෘෂ්ඨීය ප්‍රවාහනය ක්‍රියාත්මක කිරීම හෝ අනෙකුත් ගුවන් සමාගම් සහ භාණ්ඩ

ප්‍රවාහන වක්‍ර සේවා සපයන්නන් හරහා ක්‍රියාත්මක වන පෘෂ්ඨීය ප්‍රවාහනය ඇතුලු අනෙකුත් පෘෂ්ඨීය යාත්‍රා සමග ඇතිකර ගත් වැඩපිළිවෙළ තුළින් එම සේවා සැපයීම නම් කරන ලද ගුවන් සමාගම් විසින් සිය කැමැත්ත පරිදි සිදු කරනු ඇත.

ප්‍රවාහන මාදිලියට අදාළ කාරණා පිළිබඳව බඩු ගෙනයන පුද්ගලයන් දැනුවත් කර එවැනි අන්තර් මාදිලි භාණ්ඩ සේවාවන් කේවල වශයෙන් ද ගුවන් හා පෘෂ්ඨීය ප්‍රවාහන යන මාධ්‍ය දෙකෙහිම එකතුවක් වශයෙන් ද වන මිළ ගණන්වලට ලබා දිය හැකිය.

16 වන වගන්තිය

මෙහෙයුම් නම්‍යතාවය

1. මෙම අවබෝධතා ගිවිසුම මගින් බලය පවරන ලද සේවා මෙහෙයවීමේදී එක් එක් ගුවන් සමාගමට, තමාගේම ගුවන් සමාගම් හෝ මෙම සම්මුතියේ සංශෝධන සඳහා වූ සන්ධානය හා එක් එක් පාර්ශවයේ නීති හා රෙගුලාසි පිළිබඳව සැළකිලිමත් වෙමින් එක් පාර්ශවයක හෝ තුන්වැනි රටවල ගුවන් සමාගම් අතර සබඳතාවක් ඇතිකර ගැනීම් තුළින්, බදු ක්‍රමය යටතේ, උප බදු ක්‍රමය යටතේ පැය ගණනකට කුලියට ගැනීම (*"අන්තර් හුවමාරුව"* හෝ *"පැය ගණනට කුලියට ගැනීම"*) හෝ කාර්ය මණ්ඩලය සමග බද්දට ගැනීම, රක්ෂණ හා නඩත්තුව (*"බදු"*) ලෙස ගෙන ඇති ගුවන් යානයක් හෝ යොදාගත හැකිය. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් විධිවිධාන සපයා ඇති ආකාරයට පාර්ශවවල ගුවන් ගමන් බලධාරීන්, විසින් ආරක්ෂාව සඳහා වූ වගකීම කොන්දේසි පනවමින් විශේෂ ගිවිසුමකට එළඹිය යුතුයි.

2. කුමන හෝ ගිවිසුම්කාර පාර්ශවයක්, 7 වැනි සුරක්ෂිතභාවය හා 8 වැනි (ගුවන් ගමන් ආරක්ෂාව) යන වගන්තිවලට අනුකූල නොවන, මෙම ගිවිසුම යටතේ ලබා දෙනු ලබන සේවාවන් සඳහා බද්දටගත් ගුවන්යානය යොදා ගැනීමෙන් වැළකී සිටිය යුතුය.

3. මෙම ගිවිසුමේ ඇමුණුමේ දක්වා ඇති ගුවන් මාර්ගයේ ඕනෑම ස්ථානයක් හෝ ස්ථානයකදී වෙනසක් කිරීමක් සම්බන්ධයෙන් කිසිදු සීමාවක් නොමැතිව අනිකුත් ගුවන් සේවා සමග කටයුතු කිරීමේදී හුවමාරු කරගන්නා කේත යටතේ කිසියම් ස්ථානයක් අභිබවා ප්‍රවාහනය සිදුකිරීම ගුවන් සේවය නම්කර ඇති ගිවිසුම්කාර පාර්ශයෙන් දේශ භූමියෙන් ප්‍රවාහනය අඛණ්ඩව සිදු කරනවානම්, මෙහෙයවූ ගුවන්යානා ගනන, ප්‍රමාණය හෝ වර්ගය සහ කිසියම් දිශාවක් දෙසට ගමන් කිරීමේදී, ගුවන් සේවය නම්කර ඇති ගිවිසුම්කාර පාර්ශයේ දේශ භූමිය වෙත ප්‍රවාහනය සිදු කිරීම යනුවෙන් එවැනි ස්ථානයක් අභිබවා ප්‍රවාහනය අඛණ්ඩව

සිදුකිරීම ඇතුළුව ජාත්‍යාන්තර ගුවන් ප්‍රවාහනය සිදු කිරීම සඳහා ඕනෑම ගුවන්සේවයක් හිමිකම් ලබයි.

17 වන වගන්තිය

සංඛ්‍යා ලේඛන

අවශ්‍ය වුවහෝත්, එක් එක් පාර්ශවයේ ගහනගාමී බලධාරින් විසින්, ඉල්ලීම මත, කාලින හෝ අනෙකුත් සංඛ්‍යාලේඛන ප්‍රකාශන අනෙක් පාර්ශවයේ ගුවන් ගහනගාමීන් වෙත ලබා දීම සඳහා නම්කළ ගුවන් සේවයට හෝ සේවාවන්ට සැපයිය යුතුය.

18 වන වගන්තිය

කාලසීමාවන් අනුමත කිරීම

1. එක් එක් ගිවිසුම්කාර පාර්ශවයේ නම් කරන ලද ගුවන් සමාගම හෝ සමාගම් විසින් නිශ්චිත ගමන් මාර්ගවල එකඟතාවට පත් සේවාවන් ආරම්භ කිරීමට දින (30) තිහකට නොවැඩි ගණනකට පෙරාතුව, අදහස් කරන සේවාවන්ගේ කාල සටහන්, නිශ්චිත වාර ගණන, ගුවන් යානා වර්ගය, ඒවායේ ස්වරූපය, සේවාවේ ස්වභාවය සහ මගීන් සඳහා පවතින ආසන සංඛ්‍යාව ආදිය ගිවිසුම්කාර අනෙක් පාර්ශවයේ ගුවන් ගමන් බලධාරීන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. පසුව කරනු ලබන වෙනස්කම් සඳහා ද මෙය අදාළ විය යුතුය. විශේෂ අවස්ථාවකදී, එම බලධාරීන්ගේ එකඟතාවට යටත්ව කාල සීමාව අඩුකර ගැනීමේ හැකියාව පවතී.

2. යම් නම්කරන ලද ගුවන් සමාගමක් විසින් එම අනුමත කාල සටහනේ සඳහන් ගුවන් ගමන්වලට අමතර වශයෙන් අවස්ථාවට අනුකූල ගමන්වාර ක්‍රියාත්මක කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා අදාළ ගිවිසුම්කාර පාර්ශවයේ ගුවන් ගමන් බලධාරීන්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

19 වන වගන්තිය

උපදේශන

1. ගිවිසුම්කාර පාර්ශවවල ගුවන් ගමන් බලධාරීන් විසින් මෙම ගිවිසුමේ ක්‍රියාත්මකභාවය සහ එහි විධිවිධාන සහ ඇමුණුම්වල අනුකූලතාව තහවුරු කිරීමේ අරමුණෙන් එකිනෙකා සමග එක් එක් කාලවලදී සමීප සහයෝගීතාවයෙන් යුතුව සාකච්ඡා පැවැත්විය යුතුය.

2. එවන් උපදේශන, දෙපාර්ශවය විසින් එකඟතාවට පත් අන් ආකාරයක් නොමැත්තේ නම්, සාකච්ඡා හෝ ලිපි හුවමාරුව හරහා, එසේ කරනු ලබන ඉල්ලීම ලැබී දින හැට (60) ක කාලයක් ඇතුළතදී ආරම්භ කළ යුතුය.

20 වැනි වගන්තිය

ආරවුල් සමථයකට පත් කර ගැනීම

මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම හෝ අදාළ කර ගැනීම සම්බන්ධයෙන් ගිවිසුම්කාර පාර්ශව අතර යම් ආරවුලක් ඇතිවුවහොත්, පළමු කොටම එය සාකච්ඡා මාර්ගයෙන් සමථයකට පත්කර ගැනීමට ගිවිසුම්කාර පාර්ශව විසින් උත්සාහ දැරිය යුතුය.
සාකච්ඡා මාර්ගයෙන් සමථයකට පත්කර ගැනීමට නොහැකි නම්, රාජතාන්ත්‍රික මාර්ග ඔස්සේ අදාළ ආරවුල සමථයකට පත්කර ගත යුතුය.රාජතාන්ත්‍රික මාර්ග ඔස්සේ අදාළ ආරවුල සමථයකට පත්කර ගත නොහැක්කේ නම්, අදාළ ආරවුල බේරුම්කාර විනිශ්චය සභාවක් වෙත ඉදිරිපත් කළ යුතුය.

21 වැනි වගන්තිය

සංශෝධන

1. ගිවිසුම්කාර කුමන හෝ පාර්ශවයක් විසින් මෙම ගිවිසුමට ගෙන ඒමට සුදුසු යැයි සළකන ඕනෑම සංශෝධනයක් ඕනෑම අවස්ථාවක අනෙක් පාර්ශවය වෙත යෝජනා කළ හැකිය. ගිවිසුම්කාර පාර්ශවවල ගුවන් ගමන් බලධාරීන් අතර පවත්වන සාකච්ඡා හෝ ලිපි හුවමාරු හරහා පවත්වනු ලබන අදාළ සංශෝධන පිළිබඳ උපදේශන, පාර්ශව අතර එකඟතාවට පත් අන් ආකාරයක් නොමැත්තේ නම්, එම යෝජනාව අනෙක් පාර්ශවය වෙත ලැබී දින හැට (60) ක කාලසීමාවක් තුළ ආරම්භ කළ යුතුය.

2. ගිවිසුම්කාර එක් පාර්ශවයක් විසින් මෙම ගිවිසුමේ ඇමුණුම් සඳහා සංශෝධන ගෙන ඒම සුදුසු යැයි සිතන්නේ නම්, පාර්ශව ද්විත්වයෙහිම ගුවන් ගමන් බලධාරීන් එවන් සංශෝධනයක් සඳහා එකඟතාව පළ කරනු ඇත.

3. මෙම වගන්තියේ 1 හෝ 2 ඡේදවලට අනුකූලව මෙම ගිවිසුමට හෝ එහි ඇමුණුම්වලට කරනු ලබන යම් සංශෝධනයක් පාර්ශව අතර සටහන් හුවමාරු කර ගැනීමත් තුළින් තහවුරු කරගත් පසුව බලාත්මක භාවයට පත්වනු ඇත. ඒ සඳහා එකඟතාවට පත් වූ දින සිට තාවකාලිකව එය අදාළ වනු ඇත.

22 වැනි වගන්තිය

බහුපාර්ශවීය ගිවිසුම්

ගිවිසුම්කාර පාර්ශවවලට අදාළව ගුවන් ප්‍රවාහනය සම්බන්ධයෙන් බහුපාර්ශවීය ගිවිසුමක් බලාත්මක වුවහොත්, එම ගිවිසුමේ විධිවිධාන හා අනුකූලවන ආකාරයට ගිවිසුම්කාර පාර්ශව අතර සාකච්ඡා පැවැත්වීම තුළින් මෙම ගිවිසුම සංශෝධනය කළ හැකිය.

23 වැනි වගන්තිය

අවසාන කිරීම

මෙම ගිවිසුම අවසාන කිරීම පිණිස වූ තීරණය ඕනෑම ගිවිසුම්කාර පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවය වෙත ඕනෑම අවස්ථාවක රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ ලිඛිතව දැනුම් දිය යුතුය. එවන් දැනුම්දීමක්, ඒ හා සමගම ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය වෙත ද සන්නිවේදනය කළ යුතුය. එවැනි අවස්ථාවක, අවසාන කිරීමේ දැනුම් දීම අදාළ කාල සීමාව ඉකුත්වීමට ප්‍රථම එකඟතාව මත ඉවත්කර නොගන්නේ නම්, එම දැනුම් දීම ගිවිසුම්කාර අනෙක් පාර්ශවය වෙත ලැබීමෙන් මාස දොළහ (12) ක ට පෙර ගිවිසුම අවසාන කළ යුතුය. ගිවිසුම්කාර අනෙක් පාර්ශවය විසින් ගිවිසුම අවසානකිරීමේ දැනුම්දීමක් ලැබුණු බවට වූ දැන්වීම නොකෙරුණු විටෙක, එම අවසාන කිරීමේ දැනුම් දීම, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය වෙත ලැබුණු දින සිට දින දා හතර (14) ක ට පසු ලැබුණු බවට සැළකිය යුතුය.

24 වැනි වගන්තිය

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ ලියාපදිංචිවීම

මෙම ගිවිසුම සහ එයට ගෙනඑනු ලබන යම් සංශෝධනයක් ගිවිසුම්කාර පාර්ශව විසින් ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය වෙත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතුය. දා හතර (14) ක ට පසු ලැබුණු බවට සැළකිය යුතුය.

25 වැනි වගන්තිය

බලාත්මක වීම

මෙම ගිවිසුම, එය බලාත්මක වීමට අවශ්‍ය වන්නා වූ අදාළ අභ්‍යන්තර පරිපාටීන් සම්පූර්ණ කර ඇති බවට තහවුරු කරමින් ගිවිසුම්කාර පාර්ශව විසින් කරනු ලබන අවසාන ලිඛිත දැනුම් දීම රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ ගිවිසුම්කාර අනෙක් පාර්ශවය වෙත ලැබුණු දින සිට බලාත්මක භාවයට පත්වේ.

මීට සාක්ෂි පිණිස පහත දැක්වෙන ඔවුනොවුන්ගේ ආණ්ඩු විසින් පූර්ණ බලය සපයන ලද තානාපතිවරුන් විසින් මීට අත්සන් තබන ලදී.

සිංහල, පෘතුගාල් සහ ඉංග්‍රීසි යන භාෂාවලින් පිටපත් සහිතව සියලුම පාඨ සමානව සත්‍යවත් වන ලෙස සකසා දෙසැම්බර් 6, 2017 දින කොළඹ දී අත්සන් තබන ලදී.

අර්ථ දැක්වීමේ ව්‍යාකූලතාවයක් වෙතොත්, ඉංග්‍රීසි පාඨය බලපැවැත්විය යුතුය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ආණ්ඩුව වෙනුවට.

ගනේගම සේනා විතානගේ මහතා
ලේකම්
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

බ්‍රසීල ෆෙඩරල් ජනරජ
ආණ්ඩුව වෙනුවට

එලිසබෙත්- සොෆී මාසෙලා ඩි බොස්කෝ බල්සා
තානාපතිතුමිය

ඇමුණුම

මාර්ග සටහන් සැළැස්ම

සිය ගමනාන්තය පිළිබඳව නියමයන් ප්‍රකාරව, පහත මාර්ගයන් හී ස්ථාන අතර නියමිත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය සිදුකිරීම සඳහා එක් එක් පාර්ශවයේ නම්කළ ගුවන් සේවාවන්ට අයිතිය තිබිය යුතුය.

අ. බ්‍රසීල ජනරජ ආණ්ඩුව විසින් නම් කරන ලද ගුවන් සමාගම් මගින් මෙහෙයවිය යුතු ගමන් මාර්ග

මෙපිට ස්ථාන	බ්‍රසීලයේ ස්ථාන	අතර මැදි ස්ථාන	ශ්‍රීලංකාවේ ස්ථාන	එපිට ස්ථාන

ඕනෑම ස්ථානයක්	ඕනෑම ස්ථානයක්	ඕනෑම ස්ථානයක් හෝ ස්ථාන	ඕනෑම ස්ථානයක්	ඕනෑම ස්ථානයක්

ආ. ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුව විසින් නම් කරන ලද ගුවන් සමාගම් මගින් මෙහෙයවිය යුතු ගමන් මාර්ග

මෙපිට ස්ථාන	ශ්‍රී ලංකාවේ ස්ථාන	අතර මැදි ස්ථාන	ශ්‍රීලංකාවේ ස්ථාන	එපිට ස්ථාන
ඕනෑම ස්ථානයක්	ඕනෑම ස්ථානයක්	ඕනෑම ස්ථානයක්	ඕනෑම ස්ථානයක්	ඕනෑම ස්ථානයක්

සටහන්:

නම්කළ ගුවන්සේවා පාර්ශවයේ දේශභූමිය තුළ ස්ථානයක කටයුතු කරන සේවා ඇත්නම්; මෙම ගිවිසුම යටතේ දිශාමය හෝ භූගෝලීය සීමාවක් රහිතව සහ අවසරලත් ගුවන් ගමන් සිදුකිරීමට ඇති ඕනෑම අයිතියක් අහිමි නොකර; කුමන පාර්ශවයක හෝ නම්කළ ගුවන් සේවයක් මගින් සියලුම හෝ ඕනෑම ගුවන් සේවාවක් සඳහා,

1. දෙදිශාවට හෝ එක් දිශාවකට ගුවන්යානා මෙහෙය වීම;
2. එක් ගුවන්යානා මෙහෙයුමක් ඇතුළත විවිධ ගුවන්යානා ගනනක් සංයුක්ත කිරීස;
3. ඕනෑම සංයුක්ත කිරීමක් සහ ඕනෑම අනුපිළිවෙලකට ගුවන් මාර්ගවල පාර්ශවයන්ගේ දේශභූමිවල මෙපිට, අතර මැදි ස්ථාන, එපිට ස්ථාන සහ ස්ථානවල සේවයේ යෙදීම;
4. ඕනෑම ස්ථානයක් හෝ ස්ථානයක නතර කිරීම බැහැර කිරීම;
5. ගුවන් මාර්ගවල එහි ගුවන් යානයක ඕනෑම ස්ථානයක සිට එහි අනෙක් ගුවන් යානයේ ඕනෑම ස්ථානයක් දක්වා ගමන් මාරු කිරීම;
6. ගුවන් යානය හෝ ගුවන් ගමන් වාර ගනන වෙනස්කර හෝ නොකර සිය දේශභූමිය තුළ මෙපිට ස්ථානයක් හෝ ඕනෑම ස්ථානයක් සේවයේ යෙදීම සහ සේවාවන් ඔස්සේ මහජනතාව වෙත එවැනි සේවා වෙළඳ ප්‍රචාරණය කිරීම සහ සිදුකළ හැකිය.